Embassy of the United States of America

Colombo

# PRESS RELEASE

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: shenjy@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170616S

**විදේශ ඇමති රවී කරුණානායක, ශ්‍රී ලංකා නාවික හමුදාපති යූ.එස්.එස්. ලේක් ඊරි නෞකාව නැරඹීමට යති.**

**කොළඹ, ජුනි 16 :**විදේශ ඇමති රවී කරුණානායක සහ නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණරත්න, එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් හා එක්ව යූ.එස්.එස්. ලේක් ඊරි (USS Lake Erie) නෞකාවට ගොස් එහි කපිතාන් සහ කාර්ය මණ්ඩලය හමුවී, ශ්‍රී ලංකාවේ ගං වතුර සහන සේවා සඳහා එක්වීම පිලිබඳව ඔවුන්ට ස්තුතිය පුද කළහ.

"කපිතාන් ඩැරන් මැක්ෆසන් සහ සියලුම සෙබළුන් සහ සෙබළියන්ට මගේ ස්තුතිය හිමි විය යුතුයි. ඇමෙරිකාවේ ශ්‍රේෂ්ටත්වය ඔවුන් විසින් නැවත වරක් විදහා දක්වා ඇතැ" යි එක්සත් ජනපද තානාපති අතුල් කෙෂප් මෙහිදී පැවසීය. "මෙහි ඇති වැදගත්කම මෙන්ම අප දෙරටේ හමුදාවන් අතර මෙම සහන මෙහෙයුමේදී ඇතිවූ විශ්වාසය සහ පළපුරුද්ද අනාගත මානුෂික මෙහෙයුම් සඳහා පිටුවහල් වනු ඇත."

පසුගිය සති දෙක ඇතුලත, එක්සත් ජනපද හමුදා නිලධාරීන් සහ ශිෂ්‍ය හටයින් ඔවුන්ගේ ශ්‍රමය සහ විශේෂඥ දැනුම, දකුණේ ගං වතුරින් විනාශ වූ ප්‍රදේශ සහ ප්‍රජාවන් ප්‍රතිසංස්කරණය සඳහා ලබා දුනි. ශ්‍රී ලංකා නාවික හමුදාව සහ මැරීන් බලකාය ද, ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ආරක්ෂක අමාත්‍යංශය සමඟ කටයුතු කරමින්, පාසල් ශිෂ්‍යයින්ට නැවත ඉගෙනුම් කටයුතු කිරීමට හැකිවන අයුරින් පාසල් පිරිසිදු කිරීමේ කටයුතු ද, අපිරිසිදු වී ඇති ළිං පිරිසිදු කිරීමේ ක්‍රියාවලියට සහ මාතර ප්‍රදේශයේ වැව් බැම් පිළිසකර කිරීම් වලද ඔවුන් නිරත විය.

මීට අමතරව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද අරමුදල (USAID) මඟින් රුපියල් මිලියන 350 ට (ඩොලර් මිලියන 2.3) ආසන්න මුදලක්, පිරිසිදු පානිය ජලය ලබාදීමට, පිරිසිදු කිරීමේ කට්ටල සඳහා, හදිසි රැකවරණ කට්ටල සඳහා, නිවාස අලුත්වැඩියා කට්ටල සහ විවිධ රෝග පලවා හැරීමට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් ලබාදීමටද, දේශීය සංවිධාන වලට ප්‍රධානය කර ඇත.

###